

# සොඳුරුම හදවත




තුසිත් රවීන්ද්‍ර අබේනායක

සුනාමිය අවුත් ලක්බිම මුහුදුකරය වනසාලීය. රළ බැස ගියපසු ඉතිරි වූයේ මරණයත් විනාසයත් දුක් වේදනා කන්දරාවකුත් පමණි. ලොව සෑම අතින්ම පැමිණි ජනමාධ්‍යවේදීන් සිත් සසලවන ඒ තොරතුරු රූපවාහිනී පුවත්පත් රේඩියෝ මාධ්‍ය මගින් ලොවපුරා පතුරුවා ලීය. මේ අතර ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පලවන ඩේලි ටෙලිග්‍රාෆ් පතේ පුවත්පත කලාවේදිනියක ද වූවාය. ඇගේ දුක්බර ලිපිය සරසවන්නට ඈ මහලු කතකගේ ඡායාරූපයක් ද ඒ සමගම පල කළාය. සුනාමියට හසුව සිය පුතුන් ඇතුලු සිය පවුලම මියගිය පසු ඉතිරිව සිටියේ ඇය පමණය. උරුම වු එකම ඇඳිවතින් ශොපින් බෑගයකට දමා ගත හැකි තරම් වු ඇගේ මුලු සේසතමත් සමග ඈ හිස්වු ඇසින් කැමරා කාචය දෙස බලා සිටියාය. දහස් ගණනක් ඇගේ ලිපිය කියවා මහලු ගැහැණිය ගැන අනුකම්පාවෙන් ලය පුරා හෙලූ සුසුමක් සමඟ අනෙක් පිට පෙරලන්නට ඇත.
සුනාමියට වසරක් පිරෙන දිනෙක ඉහත කී ලේඛිකාවගේ ටෙලිපෝනය නාද විය. ඇමතුම නන්නාදුනන මිනිසෙකුගෙනි. තමා හඳුන්වා දුන් ඔහු වසරකට පෙර ඇය ලියූ ලිපියත් එහි වූ මහලු ස්ත්‍රියක් මතකයේ ඇති දැයි විමසීය. ඒ දුක්බර දෑසත් මනුෂත්වය මත කඩා හැලුනු වේදනාවත් ඇගේ මතකයේ දැඩිව රැඳී තිබිණි. ඉන්පසු මේ නන්නාදුනන මිනිසා අපූරු කතාවක් ඈ හමුවේ තැබීය.

ලිපිය කියවූ පසු ඔහුගේ හදවත ඈ වෙනුවෙන් උනු වීය. කලහැකි යමක් ඇති බවත් ඒ දේ කලයුතු බවත් හිතේ දැඩිව සටහන් විය. මුලින්ම ඈ කොහේ ඇත්දැයි සොයාගත යුතුය. දුරකථනය අතට ගත් හෙතෙම ඇය සොයා යාමේ චාරිකාව ඇරඹීය. කොතෙක් දුරක් හෝ ඔහු ඒ ගමන යන බව ඔහු ගැන දන්නෝ එදාත් දැගෙන සිටියහ. ඒ මග ලෙහෙසි නොවීය. ඈ පිළිබඳ කිසිඳු හෝඩුවාවක් නැති තැන ඔහු ඇගේ ඡායාරූපය සහිත පෝස්ටර් මිනිසුන් ලවා ගාල්ල නගරයේ සෑම තැනකම පාහේ ඇලවීය. තොරතුරු වෙනවෙන් විදේශීය මුදල් ත්‍යාගයක් ද ඇතුළත් වීය. දින කිහිපයකින් ම ප්‍රතිඵල ලැබිණි. මාස දහයක් මුලුල්ලේ ඇය සෙවූ ඔහු අන්තිමේදී ජය ගත්තේය. දිවි ඇති තෙක් ජීවත් වන්නට කුඩාවූත් අංග සම්පූර්ණ නවාතැනකුත් ඊට ගෙවිය යුතු මාසික කුලියත් ජීවත් වන්නට සරිලන තරම් මාසික දීමනාවකුත් ඇයට ලැබිණ. ඒ සඳහා ඔහුට ඔහුගේ හිතවතුන්ගේත් ඔහු ප්‍රධාන නිලයක් උසුලන ෆ්‍රී මේසන් සංගමයේත් උපකාර හා අනුග්‍රහය ලැබිණි.

ඒ කථාව අවසානයේ ඔහු එක දෙයකට ඇය පොරොන්දු කරවා ගත්තාය. ඒ ඔහු පිළිබඳ කිසිදෙයක් ප්‍රසිද්ධ නොකරන්නට. එහෙත් මේ සුන්දර මනුස්සයා ඇගේ සිත බෙහෙවින් ම සසල කලේය. ඔහුගේ මිනිස්කමේ උණුසුම ඇගේ මතකයේ තිබිණි. සුනාමියට දෙවසරක් පිරෙන්නට ඔන්න මෙන්න කියා තිබියදී කෙසේ හෝ ඒ ගැන ලියන්නට ඇය ඔහු කැමති කර ගත්තාය. ලිපිය පළවිය.
ඒ ලිපිය ඔහු ගැන හෝ ඔහුගේ සමාජ වැඩ ගැන කෙරුණු ගුණ ගායනයක් හෝ ඔහු පිළිබඳ දැන්වීමක් නොවීය. ඔහු කල දෑ ඇය දන්නවා නම් ලිපියක් වෙනුවට පත්‍රයේ අතිරේකයක් පල කරන්නට ඇයට සිදුවනු නො-අනුමානය. ඒ ඇය අයිවන් ලොයිඩ් ජෑන්ස් නම් සුන්දර මිනිසාගේ මිනිස්කමේ උණුසුම එකවරක් විඳගත් සැටිය.

ඒ අන්කල් ලොයිඩ් ගේ හැටිය. ඔහු උදව්වක් උපකාරයක් කලේ පුලුවන් තරම් අඩු ප්‍රසිද්ධියක් ගෙනෙන අයුරිනි. වරක් ඔහු මගෙන් මා දන්නා තැනක රූපවාහිනියක් තිබේ නම් ලබාදෙන ලෙස කීය. ඒ තවත් කාට හෝ දෙන්නට බව මම දනිමි. සති දෙකකට පමණ පසු ඒ දිනවල ලංකාවෙන් පැමිණි පවුලකට අන්කල් ලොයිඩ් රූපවාහිනියක් දුන් බව ඒ පවුලේ අය මා සමඟ කීය. පුදුමය නම් ඒ මිනිසුන් ඔහු අඳුනා ගත්තේ මා නිසාය. දිනක් මම ඔහුගෙන් ඒ ගැන විමසුවෙමි.

''ඇයි අන්කල් මට කිව්වේ නැත්තේ''
''පුතා T.V. එකක් නැති එක අඩුවක්. මම ඒ අඩුව පිරෙවුවා. මම ඕක තැන තැන කිය කියා හොයන්නේ ඇයි. උදව්වක් කරන කොට ඒ අයව අසරණ, අනුකම්පාසහගත තැනට දමන්න හොඳ නැහැ. මම ඒ අයට කිවුවේ අපේ ගෙදර ගරාජ් එකේ අයින් කරල තිබ්බ එකක් කියලා.''

අන්කල් ලොයිඩ් උදව් කරන්නේ ඒ විධියටය. දුර බැහැර තැනක රැකියාවක් ලැබුනු මගේ මිතුරෙකුට කාරයක් ගන්නට මුදල් නොතිබිණි. අපි ඒ ගැන කථා කරමින් සිටියෙමු. අන්කල් ලොයිඩ් දින කිහිපයකට පසු ඔහු කැඳවා ගෙන ගොස් කාරයක් අරන් දුන්නේය.

'' `Job එක කරලා... පුළුවන් දවසක ගෙවන්න'' දෙබස එතැනින් ඉවරය.

ඔහු මහා ධනවතෙක් නොවීය. ඒත් මහා දානපතියෙකි. පෙර පින් පතා සල්ලි පුදදෙන ''පින් අයෝජනය'' කරන්නෙක් නොවීය. තමාට කල හැකි යමක් තවකෙකු වෙනුවෙන් කිරීම ඔහුගේ අභිලාෂය විය. එවැන්නක් දුටු විටෙක හැරීයාමක් ඔහු ළඟ නොවීය.
ඔහු වෘත්තියෙන් ගනකාධිකාරීවරයෙක් විය. ණය බරෙන් නිදහස් වන්නට තවදුරටත් ඉගෙන් ගන්නට උවමනාවක් ඇති සිසුවෙක් ඉක්මණින් ණය ගෙවන්නට ඔහුගේ උපදෙස් විමසීය. බිරිඳත් කැටුව බැංකුවට ගිය ඔහු ඩොලර් විසි දහසක පමණ මුදලක් ඔහුගේ නිවාස ණයෙන් ලබාගෙන සිසුවාගේ ක්‍රෙඩිට් කාඩ්පත් වසා දැම්මේය. නිවාස ණය පොලීයට මාස්පතා ඒ මුදල හැකි අයුරු ගෙවන්නට සලස්වා ඔහුගේ උසස් අධ්‍යාපනය කරගෙන යන්නට ඉඩ සාදා දුන්නේය.
මෙවැනි මා දන්නා කථා බොහෝය. මා පුදුමයට පත් වන්නේ ඔහු ගැන දන්නා තවත් අයෙක් මා නොදන්නා මෙවැනි කථා බොහෝ මයක් මා සමඟ පවසන විටය.

මරේ ගඟ දිගේ දින කිහිපයක් තිස්සේ වාර්ශිකව යන බෝට්ටු සවාරිය ඔහුගේ මහත් සිත් ගත් විනෝද අංගයක් විය. ඊට ආරාධනා ලබන්නට තරම් මම මහත් වාසනාවන්තයෙකු විමි. මගේ දරුවන් ඕස්ට්‍රේලියාවේදීත් මා ලංකාවේ දී විඳි චමත්කාරය විඳින්නට මඟ පෑදුයේ ඔහුය. රූස්ස ගම් ගස් සෙවණින් වැසුණු ඉවුරු අතර ඔහු ''බෝට්ටු ගෙදර' සීරුවෙන් හසුරුවා ගෙන යයි. අතක මධුවිතය.
''ඔයාලා මේවා ඉගෙන ගන්න ඕන. නැත්නම් කොහොමද මම මැරුනම පුතාලා එක්ක එන්නේ.' ඔහු කියනා අයුරු මට මැවී පෙනෙයි.
මගේ දරුවන් හිම බලන්නට ගෙන ගියේ ඔහුය. මහා වැස්සක් මෙන් හිම පතිත වූ දිනෙක රථයේ රෝද යට රිංගා මා ලවා දම්වැල් දැම්මවූයේ ඔහුය.

''අපරාදෙ නේ. කඩෙන්ම දාගෙන ආවා නම් ලේසියිනේ'' තෙත බරිත ඇඳුම් ගලවා ලන අතරේ මම වෙව්ලමින් කීමි.
''එහෙම කලා නම් පුතා ඉගෙන ගන්නේ නෑනේ'' ඔහු කීය.
චීනාසි සටන් ක්‍රමයේ කලුපටිධාරී ඔහු පිහි විසිකිරීමේත්, දුන්නෙන් විදීමේත් හසල දැනුමැත්තෙකි. අපට දුනු විදීම හුරුකරවූයේ ඔහුය. බෝට්ටු සංචාරයේ දී පාලු කැලෑවකදී මේ ඉලක්කයට විදීම අරඹන අය දුනු හී සෙල්ලම ඉවර කරනනේ ඉඩ හැරුනාටත් පසුය. එතෙක් හේ ඉවසිල්ලෙන් මත්පැන් පොදක්වත් තොල නොගා ගුරුහරුකම් දෙයි.

දිනක් අප රට මැද ඇති මසුන් මරන්නට ප්‍රසිද්ධ විලක් අසල දින කිහිපයක් පැමිණ සිටියෙමු. සැදෑ අහස රන්වන් ව දිලිසෙන ජලතලය කපාගෙනන විසල් ඩොල්පින් ධෙනුවකුත් ඇගේ පැටියාත් අහසට ඉගිලුනි. ඔවුන් දිය කපාගෙන දියට වැටෙනා විට විසි-රුනු වතුර බිඳු අප සියල්ල තෙමාලීය. ඒ විරළ සොඳුරු දසුනින් මම කුල්මත් වීමි. කෘතඥ පූර්වක හැඟීමෙන් මම ඔහු දෙස බැලීමි. ඔහු මා දෙස බලා හිස වැනීය. අපි වදනක්වත් නොදෙඩීමු. උපැස් යුවල පසුපස වූ ඒ දෑසේ ඔහුගේ දරුවන්ගේ සතුට දකිනා විට නැගෙන තරම් සොම්නසක් පිරී තිබිණි.

දැඩිව දෙවියන් ඇදහූ ඔහු කිසිදිනක දෙවියන්ගේ කිසිම දෙයක් නොඉල්ලන බව මා සමඟ කියා තිබිණි. ''පුතා ඇයි තව දේවල් ඉල්ලන්නෙ. මම කරන්නේ මට ලැබුණු දේවල් ගැන උන්වහන්සේට ස්තූති කරන එක විතරයි''

උන්වහන්සේට ස්තූති වන්නට මහලු වියේ ලෙඩ රෝගවලටත් ලෙඩ ඇඳක් මත දිවි ගෙවන්නටත් ඉඩක් නොතබාම අන්කල් ලොයිඩ් 15/12/2006 දින ඉතා සන්සුන් විලස හදිසියේ අප අතරින් සමු ගත්තේය. ඒ හැමදාමත් ඔහු පැතූ ලෙසටම ය. විසි වසරකටත් පෙර විවෘත හදවත සැත්කමකට ඔහු මුහුණ දුන්නේය. එයින් පසු ජීවත් වූ සෑම දිනක්මත් කල සෑම දෙයක්මත් දෙවියන්ගේ තෑග්ගක් ලෙස ගත් ඔහු උන්වහන්සේගේ තුරුළට යන්නට සැහැල්ලු සිතින් සිටියේය.
වියෝගය දැනෙනුයේ වෙන්ව ගිය ඔහුට නොවේ. වෙන් වී යාම දරාගත නොහැකි වූ ඔහුගේ මිනිස්කමේ ගුණ සුවඳ විඳගත් ජීවත් වන අයටය. එහෙත් මියගිය ඔහුගේ මුහුණේ ඔහුගේ සුපුරුදු ශාන්ත මද සිනහව එලෙසම රැඳී තිබිනැයි ඒ මො-හොතේ ඔහු දුටු මා මිතුරන් දෙදෙනෙක්ම මට කීය. ඒ සිනහව මා ඉදිරියේ මැවී පෙනෙනා මේ මො-හොතේ සුහද සිතින් ඔහුට සමුදෙන්නට මට පුලුවන.

අන්කල් ලොයිඩ් ඔබට සුබ ගමන්.
තුසිත් රවී අබේනායක

## සුභාෂිතයෙන්

''සකල සුර නරන් මුඳුනත සැදූ පද
විපුල මුනි සරන හැර අන් සුරන් වැඳ
නිමල මොක් පිනිස සත් සුරකිනු දුලද
දිඹුල මල නිසා වෙහෙසෙනු වැනි දියැද''

අන්වය :
සකල සුර නරන් මුඳුනත පද සැදූ විපුල මුනි සරන හැර අන් සුරන් වැඳ නිමල මොක් පිනිස
ත දුලද සුරකිනු දිඹුල මල නිසා දියැද වෙහෙසෙනු වැනි.

සකල සුර නරන් මුඳුනත = සියලු දෙවියන්ගේත් මිනිසුන් ගේත් හිස මත පද සෑදු = පාදය පිහිටවූ (වැඳුම් ලැබූ) විපුල මුනි - (ගුනයෙන්) මහත් වූ බුදුන්ගේ, සරන හැර, පිහිට (නොතකා) අත්හැර දමා, අන් සුරන් වැඳ = වෙන වෙන දෙවිවරුන් වැඳ, නිමල මොක් පිණිස = නිර්මල වූ (මෝක්සය) නිවන ලබා ගනු පිනිස, සත = සත්වයා (මිනිසා) දුලද රකිනු (දුර්ලබ්දිය) මිත්‍යාදෘස්ටිය සුරැකීම (ආරක්සා කිරීම) (හරියට) දිමුල මල නිසා = දිඹුල් (අත්තික්කා) මල් අපේක්සාවෙන් දිය ඇඳ වෙහෙසෙනු වැනි = වතුර ඇද ලා මහන්සි වීම වැනි ය.
මේ කවියේ ඇත්තේත් කලින් කී කවියේ අදහසමය. මුඳුනත පද සෑදු යනුවෙන් අදහස් කරන ලද්දේ පා මත හිස තැබූ යන තේරුමය්. දුලද සුරකිනු යනු මිත්‍යාදෘස්ටිය වැලඳ ගෙන එය අනුයෑමය්.
දිඹුල්, දිවිල්, ඉඹුල් ගස් තුන් වගයකි. දිඹුල් යන්න 'අත්තික්කා (ය්) යන දෙමල වචනය නිසා යටපත් වී ඇත. දිඹුල් ගසේ මල් නොපිපේ. රුක්මලටත් පෙති නැත. දිඹුල් ගෙඩි ලෙස අප අඳුන්වන්නේ දිමුලේ කඳේ හැදෙන දිඹුල් මල් බව කියති. එහි රේනු ඇත්තේ වටය/ගෙඩිය ඇතුලේය. දිඹුල් ගසේ බෝවීම සිදුවන්නේ කුරුල්ලන් ගිලපු (මලේ) ගෙඩියේ ඇති ඇටවලින් දැයි තිර කොට කියන්නට නොදනිමි.

විකසිත

---

4 වන පිටෙන්



සේරම අමූලික බොරු.
නමුත් අපේ පක්ෂයේ ඉඳලා විනය විරෝධී ක්‍රියා කරලා පක්ෂයෙන් ඉවත් කළ පිරිසක් රවිරාජ් ඝාතනයට සී.අයි.ඩී.ය අත්අඩංගුවට ගෙන තියෙනවා. ඒ අයව පක්ෂයෙන් ඉවත් කළ පසු අප සමඟ කිසිදු සම්බන්ධයක් ඒ අයගේ තිබුණේ නෑ.
ඊටත් ඒ අත්අඩංගුවට ගෙන ඇති අය රවිරාජ් මරන්න සම්බන්ධද? නැද්ද? කියලා අපි දන්නේ නෑ. එහෙම කරලා තිබුණත් අපේ කිසිම සම්බන්ධයක් රවිරාජ් ඝාතනයට නෑ. මොකද ඊට සම්බන්ධ අය අපේ පක්ෂයේ අය නොවේ. ඒ අය ඉස්සර පක්ෂයේ ඉඳලා ඉවත් කරපු පිරිසක්. ඒක නිසා එහි වගකීම භාර ගන්න අපට බෑ.

***එ.ජා.ප. පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. මහේෂ්වරන් මහතා පසුගියදා කොටින්ට නැව් මගින් ගුවන් යානා අමතර කොටස් ගෙන යෑමට උත්සාහ කර අසුවුණා. නමුත් රජය මීට නීතිමය වශයෙන් විදිමත් පියවරක් ගත්තේ නෑ. ඒ ඇයි?***
ඔය මන්ත්‍රීවරයා කොකා කෝලා බෝතලේ ඇතුලේ ඩිසල් දමා කොටින්ට යවා ඔවුන්ගෙන් සල්ලි අරන් කෝටිපතියෙකු වු අයෙක්. එයා කිසිම විශ්වාසයක් තැබිය හැකි පුද්ගලයෙක් නොවේ. දෙපිට කාට්ටුවෙක්. එක පැත්තකින් යු.එන්.පී. යට වැඩ කරනවා. අනෙක් පැත්තෙන් කොටින් සමඟ ජාවාරම් කරනවා. අනෙක් පැත්තෙන් ආණ්ඩුව සමඟ ගණුදෙනු කරනවා.
මෙයා හරියට 'බාබු' වගේ චරිතයක්. ඒක නිසා කව්රු කව්රුත් මෙයාගෙන් ප්‍රවේශම් වුණොත් හොඳයි. මෙයා බිස්නස්කාරයා. කිසිම ප්‍රතිපත්තියක් නෑ. මේ වගේ අයට විරුද්ධව රජය නිස පියවර ගැනීම වැදගත්.

සාකච්ඡා කළේ - ශ්‍රී ලාල් ප්‍රියන්ත

■